# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2196/22 - 2020 ඔක්තෝබර් මස 06 වැනි අඟහරුවාදා - 2020.10.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

**2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග**

2020 අප්‍රේල් මස 8 දිනැති අංක 2170/4 *අති විශෙෂ ගැසට්* නිවේදනයේ සහ 2020 ජූලි මස 1 දිනැති අංක 2182/32 *අති විශෙෂ ගැසට්* නිවේදනයේ (නියෝග) ප්‍රකාශයට පත් කරන ලද නියෝගවලට අමතරව, එකී නියෝගවලට යටත්ව විවෘත කරන ලද විශේෂ තැන්පතු ගිණුම්, තැන්පතු කල්පිරීම සඳහා නම් කරන ලද දිනය ඉක්මවීමෙන් පසුව ද, විශේෂ තැන්පතු ගිණුම් ආකාරයෙන් ම අළුත් කිරීමට සහ පවත්වාගෙන යාමට අවසර දෙනු ලැබේ.

තැන්පතු කල්පිරීමේ දිනය ඉක්මවීමෙන් පසුව පවත්වාගෙන යන විශේෂ තැන්පතු ගිණුම්, බලයලත් වෙළෙඳුන් විසින් සාමාන්‍ය කාලීන තැන්පතු සඳහා ලබා දෙන පොළී අනුපාත සඳහා පමණක් සුදුසුකම් ලබන අතර, එවැනි විශේෂ තැන්පතු ගිණුම්වල ඇති අරමුදල් කාලීන තැන්පතු වල කල් පිරීම මත විදේශ මුදල් බවට පරිවර්තනය කිරීම සහ ආපසු යැවීම නිදහසේ සිදු කළ හැකිය.

මහින්ද රාජපක්ෂ,<br>
මුදල් අමාත්‍ය.

මුදල් අමාත්‍යාංශය,<br>
කොළඹ 01,<br>
2020 ඔක්තෝබර් මස 06 වැනි දින.

10 - 1032

1A - G 33096 — (2020/10)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*